# රූපවාහිනී මාධ්‍ය භාවිතයට අවශ්‍ය තාක්ෂණික සාක්ෂරතාව පිළිබඳ ග්‍රාහක කේන්ද්‍රීය විමර්ශනයක්

**නන්දන මිල්ලගල**

රූප වහනය කරන්නිය යන අදහසින් 'රූපවාහිනී' යන යෙදුම ව්‍යවහාර වේ. ස්වදේශික සමාජයට එය අපූරු අරුත් දනවන්නකි. ප්‍රවීණ මාධ්‍යවේදී එම්.ජේ. පෙරේරා විසින් යෝජිතව සමාජ සම්මත වූ 'රූපවාහිනී' නාමය, අනාගතයේ තත් මාධ්‍ය පිළිබඳ පැවතියා වූ අපේක්ෂා විශ්වාසාදිය ගම්‍ය කරයි. රූප වාහනය හෝ රූප වාහන් වැනි පුරුෂ ප්‍රත්‍යවලින් නොතබා 'රූපවාහිනී' යනුවෙන් ස්ත්‍රී ප්‍රත්‍යයෙන් ම තැබීම විමසා බැලිය යුත්තකි. පෙරදිග සෞන්දර්යයේ සිරිදෙව්දුව ස්ත්‍රියයි. ඇය ලාලිත්‍යයේ ද, රමණීයත්වයේ ද ප්‍රතිමූර්තියයි. එවැනි වූ ළඳ බොළඳ - මුදු සුමුදු නම්‍යශීලී සෞන්දර්ය ගති ස්වභාවයන් මෙම මාධ්‍ය සංදේශනයෙන් ද අපේක්ෂා කළ බවයි පෙනෙන්නේ. එසේම මාතෘත්වයේ පරම පූජනීය ගුණධාරිණී ඇයයි. සකල විධ පෝෂ්‍ය පදාර්ථ රසවත් ආහාරයක් බවට පත්කර බිළිඳුන්ට පොවන්නී මවයි. එකී පවිත්‍ර සංදේශනයක් මෙම මාධ්‍යයෙන් ද බලාපොරොත්තු වන්නට ඇත. ගෘහස්ථ කළමනාකරණයේ ද, අරපිරිමැස්මේ ද බුහුටිකම් පළකරන්නී ඇයයි. රූපවාහිනී මාධ්‍යයෙන් මෙරට සමාජය එවැනි හුරුබුහුටිකම්වලින් සුපෝෂණය කිරීමට සිතූ වගයි. එසේ වූ කල 'රූපවාහිනිය' යන යෙදුම කෙතරම් අරුත් සම්පන්න ද? එය හුදු යෙදුමක් පමණක් නොවන දැවැන්ත අරුත් සමූහයකින් සමෝධානිත වූවකි. ඉන්දියාවේ දූරදර්ශන් හෝ ඉංග්‍රීසියේ ටෙලිවිෂන් (Television) යන යෙදුම්වලට වඩා 'රූපවාහිනී' යන්න අර්ථපූර්ණ වන්නේ එබැවිනි.

එකී පරමාර්ථපූර්ණ භාවිතයක් මෙරට රූපවාහිනිය සතු දැයි විමසා බැලිය යුත්තකි. වචනයේ පරිසමාප්ත අරුතින් ම ජනමාධ්‍යයක් ලෙස ස්වකීය කාර්යභාරය ඉටුකර ඇත්දැයි පිරික්සීම ද කාලීන අවශ්‍යතාවකි. එසේ වුවත් විද්‍යුත් මාධ්‍ය

ගනයෙහිලා සැලකෙන මෙම මාධ්‍ය රූපයට තාක්‍ෂණික ජීවයක් ලබාදෙන මායාමය ප්‍රකාශන විධියක් යන මතය ද බැහැර කළ නොහැකි ය. යම් රූපාකාර වස්තුවක් වීඩියෝ කැමරාව මඟින් විද්‍යුත් ප්‍රතිබිම්බයක් බවට පත් කර අවකාශීය විද්‍යුත් තරංග ඔස්සේ ඈතට ප්‍රවාහනය කර රූපවාහිනී යන්ත්‍රයක් මගින් නැවත රූපාකාර දසුනක් ලෙස නැරඹීමට හැකිවන පරිදි මෙම මාධ්‍ය නිර්මාණය වී ඇත. එය රූපය - තාක්‍ෂණය - දැකීම - සංජානනය - අර්ථකථනය වැනි සංකීර්ණ ක්‍රියාවලියක් මඟින් සිදුවන සන්නිවේදනයකි.

ඓතිහාසික දෘශ්‍ය රූප පද්ධතීන්වල වුව ද සංඥාර්ථවේදීය පදනමක් පැවතුණි. චිත්‍රය, මූර්තිය හෝ සලකුණු ආදිය යම්කිසි තාක්‍ෂණික සංවිධාන රටාවක් ඔස්සේ අදහස් (අර්ථ) සන්නිවේදනය කිරීමට යොදා ගනියි. ඡායාරූපය හා සිනමාව වැනි වියරණ ක්‍රම ඔස්සේ රූප සංවිධානය සිදු වේ. විධිමත් අර්ථ ප්‍රකාශනවලට එය අත්‍යවශ්‍යය. ඒ සඳහා කතන්දරය වැනි ආකර්ෂණීය මෙන්ම ජනප්‍රිය ක්‍රම උපයුක්ත කර ගැනීමෙන් රූපීය ප්‍රකාශනය ප්‍රේක්‍ෂකාගාරයට පහසුවෙන් ළඟා වේ. රූපවාහිනිය ද එකී ඓතිහාසික දෘශ්‍ය රූපී සන්නිවේදනයේ නූතන භාවිතයයි. අන් මාධ්‍ය අභිබවා එය සමාජ ව්‍යවහාරයට ප්‍රවිෂ්ට වී ඇත. එබැවින් රූපවාහිනී නැරඹීමට හෝ බැලීමට ප්‍රේක්‍ෂකාගාරයේ වැඩි නැඹුරුවක් පෙන්නුම් කරයි. මෙම විමර්ශනයේ දී රූපවාහිනිය ජනමාධ්‍යයක් ලෙසත්, එමගින් විවිධ නිර්මාණාත්මක ප්‍රකාශන ජනිත කළ හැකි බවත් ඒවායෙහි සන්නිවේදනාර්ථ හඳුනාගැනීමට නම් රූපවාහිනිය නැරඹීමෙන් එහා ගිය 'කියවීමක්' අවශ්‍ය බවත් අධ්‍යයනයට ලක්වේ.

නූතන හා නව මාධ්‍ය භාවිතය මගින් 'දැනුම් සමාජයක්' (Knowledge Society) ගොඩනැගෙන බවට මතයක් පළ වේ. එහිදී මාධ්‍ය සාක්‍ෂරතාව (Media Literacy) අත්‍යවශ්‍ය වේ. මාධ්‍ය සංදේශ අවබෝධ කරගෙන රසවින්දනය කිරීමටත් ඒ සඳහා විවිධ ප්‍රතිචාර දැක්වීමටත් මාධ්‍ය කියවීම අවශ්‍යම සුදුසුකමකි. මෙය රූපවාහිනී මාධ්‍යයට ද අදාළ ය. දැනුම් සමාජයේ ඵලදායී ලෙස සැරිසැරීමටත් එහි පවත්නා ගැටලු හා අභියෝග අවබෝධ කරගැනීමටත් රූපවාහිනී මාධ්‍ය සාක්‍ෂරතාව තිබිය යුතු වේ. රූපවාහිනී මාධ්‍ය බහුලව ව්‍යාප්ත වූ සමාජයක මාධ්‍ය වැඩසටහන් විවිධාංගීකරණය වී ඇති පසුබිමක එහි සමාජමය බලපෑම විවිධ ය. එසේම රූපවාහිනිය මගින් වහළුන් බිහි කිරීම වෙනුවට ප්‍රබුද්ධ විචාරශීලී ප්‍රේක්‍ෂක සමාජයක් ගොඩනැගීමට මාධ්‍ය සාක්‍ෂරතා අධ්‍යාපනයක් අවශ්‍ය වේ. රූපවාහිනී මාධ්‍ය ව්‍යාකරණය හෙවත් රූප භාෂාවේ සංඥාර්ථවේදීය සම්මුතීන් අධ්‍යයනය කළ යුත්තේ එබැවිනි.

රූපවාහිනී මාධ්‍ය සරල ප්‍රවේශ තුනකින් හඳුනාගත හැකිය.

1. රූප-ශබ්දමය මාධ්‍යයක්

2. දෘශ්‍ය-ශ්‍රව්‍ය මාධ්‍යයක්

3. විද්‍යුත් මාධ්‍යයක් වශයෙනි.

රූපවාහිනී මාධ්‍යයේ සංදේශ නිර්මාණය වන්නේ රූපමය හා ශබ්දමය සංකේතීය සංවිධානය මගිනි. ඒ සඳහා වීඩියෝ තාක්‍ෂණයේ රූප-ශබ්දමය ව්‍යවහාරය ගැන අවබෝධයක් සන්නිවේදක පාර්ශවයට මෙන්ම ප්‍රේක්‍ෂක සමාජයට ද තිබිය යුතු ය.

රූපවාහිනියේ ප්‍රකාශන සිදු කළ හැක්කේ රූපමය හා ශබ්දයම ප්‍රයෝග හෙවත් උපක්‍රම ඇසුරෙනි. වීඩියෝ තාක්ෂණය මගින් රූපය හා ශබ්දය සුවිශේෂ ප්‍රකාශන පරිසරයක් තුළ ගොඩනගයි. වර්තමානයේ ඩිජිටල් (Digital) වීඩියෝ කැමරා තාක්ෂණය මගින් රූපය මෙන්ම ඊට අවශ්‍ය ආලෝක තත්ත්වයන් පාලනය කළ හැකි අතරම ශබ්දය පටිගත කිරීමේ කාර්යය ද සිදු වේ. මේ සියල්ල එක්තැන් වූ කැම්කෝඩ (Camcorder) ක්‍රමය වීඩියෝ තාක්ෂණයේ දියුණු කළ අවස්ථාවකි. එසේම අනෙකුත් නිශ්චල කැමරාවකට (Still Camera) වඩා වීඩියෝ කැමරාවේ (Video Camera) තාක්ෂණික ප්‍රකාශන ශක්‍යතා ද වෙනස් ය. කැමරා වර්ග දෙකේම කාච (Lence) මගින් ආලෝක භාවිතය පාලනය වුව ද වීඩියෝ කැමරාවේ ආලෝක තරංග ක්‍රමය යොදා ගැනේ. සාමාන්‍ය කැමරාවේ රසායනික ක්‍රියාවලියක් මගින් රූප සටහන් වුව ද වීඩියෝ කැමරාවේ ඇත්තේ විද්‍යුත් ප්‍රතිබිම්භකරණයකි. සාමාන්‍ය කැමරාවට අනුව පිළිබිඹු මුද්‍රණයක් සිදු වුව ද වීඩියෝ ක්‍රමයේ සම්ප්‍රේෂණ ක්‍රියාවලියක් නොහොත් පරිපථ භාවිතයක් සිදුවේ. ඒ අනුව රූපවාහිනියේ භාවිත වීඩියෝ තාක්ෂණය මගින් ආලෝක සටහන් විද්‍යුත් සටහන් බවට පත්කර සම්ප්‍රේෂණය කරනු ලබයි. යථෝක්ත මුඛ්‍ය මූලධර්මීය තාක්ෂණික ව්‍යවහාරය මත රූපවාහිනියේ සකලවිධ ප්‍රකාශන ශක්‍යතා නිර්මාණය වේ.

තත්ත්පර කීපයක කෙටි කාල අවකාශීය ප්‍රකාශනයක වුව ද දකින්නේ රූප පෙළක් හා ඊට සම්බන්ධ ශබ්දාවලියකි. භාෂාමය ප්‍රකාශනයක ශබ්ද සංවිධානයෙන් වචන ද වචන සංවිධානයෙන් වාක්‍ය ඇතුළු දීර්ඝ ප්‍රකාශන ද ගොඩනැගේ. එලෙසම, විවිධ ප්‍රභේදී රූප, කෝණ රූප, චලනවේගී රූප, තිරස් හා සිරස් චලන රූප මෙන්ම ඊට අදාළ ආලෝකය, වර්ණය, ශබ්දය ආදී උපක්‍රම සියල්ල අර්ථාන්විත ලෙස පුරුද්දා එකට ගලපා ඉදිරිපත් කරයි. රූපවාහිනිය හෝ වීඩියෝ තාක්ෂණය සමග සබැඳෙන අනෙකුත් දෘශ්‍ය ප්‍රකාශන කියවා ගැනීමට යම්තාක් දුරට හෝ යථෝක්ත ව්‍යාකරණාංග පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය.

රූප ප්‍රභේද අතර සමීප රූපය (Close-up) යම් වස්තුවක ප්‍රබලව මතු කර පෙන්වන කොටසකි. පුද්ගලයෙකුට සාපේක්ෂව හිස වැනි කොටසක් තිරයේ දිස්වේ. එයින් ද ඇසක්, තොල්, නාසය, වැනි කොටසක් අති සමීප රූපයක් (Extreme Close-up) ලෙස පෙන්විය හැකි ය. විශාල ගසක් වැනි වස්තුවක මලක් හෝ ළදලු කීපයක් සමීප රූපයක් විය හැකි ය. මලක රේණු අතර කෘමියකු සැරිසරන අයුරු අතිසමීප රූපයක් වේ. ප්‍රකෘති ඇසින් දැකීමට දුෂ්කර මෙවැනි රූපයක් රූපවාහිනියේ ප්‍රබල දෘශ්‍ය සංඥාවක් බවට පත්වේ. එයින් සන්නිවේදිත අර්ථ ගණනාවක් තිබිය හැකි ය. සමීපබව, අභ්‍යන්තරික සියුම් චලන නිරූපණය, හැඟීම් ප්‍රකාශන, සැඟවුණු සියුම් තත්ත්ව නිරූපණ ආදී වශයෙනි. යම් සමාජයක පුද්ගල ජීවිතයෙහි සැඟවුණු දුක - සැප ආදිය තීව්‍ර ලෙස දැනවීමට උපයෝගී කරගත හැකි ය. ප්‍රකාශිත පණිවිඩයට සාපේක්ෂව සමීප රූපයක අර්ථ අනන්‍ය විය හැකි ය.

මධ්‍ය රූපය හෙවත් මැද රුව (Medium Shot) යම් වස්තුවක අඩක් වැනි කොටසකි. මිනිසෙක් නම් ඉනෙන් උඩ කොටස විය හැකිය. ගසක් නම් අතුපතර කොටසක් වේ. යමෙක් හෝ යමක් හඳුනාගැනීම, පුද්ගලාන්තර සබඳතා චරිත සම්බන්ධතා, අනාවරණය වැනි අර්ථවල භාවිත කළ හැකි ය.

දුර රූපය (Long Short) අදාළ වස්තුව සම්පූර්ණයෙන් තිරයේ දිස්වේ. ඊට අමතරව වෙනත් පුද්ගලයින් හා පාරිසරික හා පසුබිම් සාධක ද දැක් වේ. පරිසර වර්ණනා පසුබිම් නිරූපණ සහිතව යම් ප්‍රකාශනයකට යෝග්‍ය රූපයකි.

සමීප, මධ්‍යම හා දුර යන මූලික රූප ප්‍රභේද අදාළ ප්‍රකාශනයට අනුව සංවිධානය කිරීම රූපවාහිනී සන්නිවේදනයේ දී ඉතාම වැදගත් වේ. එසේ ම, තිරස් චලන රූපවලදී (Panning Shot) කැමරාව වමට හෝ දකුණට (Left to right, Right to Left) හැරවීමෙන් රූප ග්‍රහණය කර ගැනීමය. යමක ජංගමශීලීබව, චලනය වන ස්වභාවය සජීවීබව වැනි අර්ථ පළ කළ හැකි ය. එමෙන්ම කැමරාව සිරස් අතට හැසිරවීමෙන් ලබාගන්නා රූප ද (Tilting Shot) යම් වස්තුවක ඉහළ සිට පහළට හෝ පහළ සිට ඉහළට (Upto town or down to up) දැක්විය හැකි ය. උසස් මට්ටමක සිට දුර්වල තත්ත්වයකට ඇදවැටීමක් හෝ ජීවිතයේ පත්ලේ සිට ජයග්‍රහණය වෙත ළඟාවීමක් වැනි අර්ථ දැක්විය හැකි ය.

කැමරා කෝණවලින් (Angle Shots) ග්‍රහණය කර ගන්නා රූප ද වැදගත් ය. යමක ප්‍රකෘති, ස්ථාවර යථාර්ථවත් ස්වරූපය නිරූපණය කිරීමට ඇස් මට්ටමේ කෝණ රූපය (Eye Level Shot) යොදා ගත හැකි ය. කැමරාව පහළ සිට වස්තුව ඉහළ පෙනෙන ආකාරයේ යටි කෝණ රූපය (Low angle Shot) මගින් වස්තුව දුරට විහිදුණු, පැතිරුණු ආකාරයෙන් දිස් වේ. ජයග්‍රහණය, අභිමානය. ප්‍රෞඩත්වය ආදී අරුත් පළ කිරීමට යෝග්‍ය වේ. එසේ ම කැමරාව ඉහළ සිට වස්තුව පහළ පෙනෙන ආකාරයේ උඩු කෝණ රූපය (High angle Shot) යම් වස්තුවක්, ඇකිළී කුඩු වී පෙන්වයි. එයින් අසරණ බව, පරාජිත බව සැලවුණු බව දුප්පත්කම වැනි අර්ථ පළ කළ හැකි ය.

එසේ ම රූප චලනය කරන වේගය අනුව ද ප්‍රකාශනවල අර්ථ වෙනස් කළ හැකි ය. සාමාන්‍යවේගී චලනය (Normal Motion) මගින් යමක් ඇත්ත ඇති සැටියෙන් පළ කිරීමට යෝග්‍ය වේ. සාමාන්‍ය තත්ත්වයට වඩා වැඩි වේගී චලනය (Fast Motion) නොවැදගත් කාලය, ඉක්මනින් ගෙවා දැමීම හාස්‍ය මැවීම වැනි අර්ථ පළ කළ හැකි ය. සාමාන්‍ය ස්වභාවයට වඩා අඩුවේගී චලනය (Slow Motion) මිහිරි අතීතාවර්ජනය, යම් සිදුවීමක ස්වභාවය පිළිබඳ සුපරීක්ෂණය ආදී තේරුම් දැනවීමට උචිත ය.

රූප රාමු හෙවත් දර්ශන තලවල පෙනී සිටින පුද්ගලයින්ගේ වේශ නිරූපණ, අභිනය ආදිය ඇතුළත් රඟපෑම් ද රූපයකට ජීවය එක් කරන ප්‍රකාශන අංගයන් ය. එමෙන්ම රූපවාහිනී ප්‍රකාශනයක දී ආලෝකකරණය (Lighting) සහ වර්ණ භාවිතය (Colouring) වැනි ක්‍රම මගින් දෘශ්‍ය ප්‍රකාශන විභූෂණය කළ හැකි ය. ඉදිරිපස ආලෝකය, පැති ආලෝකය, පිටුපස ආලෝකය ආදියේ දී ප්‍රකාශිත අර්ථ වඩාත් තීව්‍රභාවයට පත් කළ හැකි ය. එසේම වර්ණ භාවිත සියුම් මනෝවිද්‍යාත්මක ගැලපුම් ඔස්සේ අර්ථ ජනනය කරන අතර සමාජ සම්මුතික අදහස් ගොඩනැගිය හැකි ය.

රූපවාහිනිය දෘශ්‍ය මාධ්‍යයක් පමණක් නොව, එහි ශ්‍රව්‍යමය කොටසක් ද පවතී. එහෙත්, හැමවිටම දෘශ්‍ය රූපය ප්‍රබලත්වයට පත් කරන අංග වශයෙන් හඬ ප්‍රයෝග හෙවත් ශ්‍රව්‍ය උපක්‍රම යොදා ගනී. එහිදී භාෂාව මගින් දෙබස්, පසුබිම් කථන, නිවේදන, විස්තර කථන මගින් රූපයට ජීවය කවනු ලබයි. එසේම සංගීතය මගින් ද භාවික ප්‍රකාශන, ගැටුම් හා සංකීර්ණතා නිරූපණය, අවස්ථා නිරූපණ, තේමා වාදන වැනි අරුත් ප්‍රතිපාදනය කරයි. එසේම රූපවාහිනී ප්‍රකාශන වඩාත් තාත්ත්විකව හා

යථාර්ථවත් ලෙස සිදු කිරීමට නොයෙකුත් ස්වභාවික ශබ්ද හා නිර්මිත ශබ්ද උපයෝගී කර ගැනේ. එසේම නිශ්ශබ්දතාව කළමනාකරණය කිරීම ද අත්‍යවශ්‍ය වේ. පොදුවේ යථෝක්ත ශ්‍රව්‍ය-දෘශ්‍ය ප්‍රකාශන ප්‍රයෝග අර්ථාන්විතව භාවිත කිරීමට රූපවාහිනී සන්නිවේදකයා උත්සුක වේ.

රූපවාහිනිය, බැලීමට හෝ නැරඹීමට එහා ගිය කියවීමක් බවට පත්කර ගැනීමට නම් අවම වශයෙන් යථෝක්ත තාක්‍ෂණික ව්‍යාකරණාංග අවබෝධ කරගැනීමට ප්‍රේක්‍ෂකයා සමත්විය යුතු ය. දියුණු දැනුම් සමාජයක (Reading Society) යථාර්ථවත්ව සැරි සරමින්, ජීවිතය හරවත්ව දිසාගත කිරීමට උචිත වැඩසටහන් හෝ නාලීන් තෝරාගැනීමට රූපවාහිනී ප්‍රේක්‍ෂකයාට හැකි වන්නේ එකී සාක්‍ෂරතා ඥානය සාක්ෂාත් කර ගැනීමෙන් පමණි. එතෙක් රූපවාහිනී මාධ්‍යයෙන් අපේක්ෂිත උසස් පරමාර්ථ සාධනය කර ගැනීමට දුෂ්කර වනු ඇත. හුදු අනුකාරකවාදී, මානසික වහල්භාවයෙන් යුක්ත සමාජයක් බිහිවන්නේ, රූපවාහිනිය කියවා ගැනීමට තරම් සාක්‍ෂරතා ඥානයක් හා මාධ්‍ය තාක්‍ෂණික අධ්‍යාපනයක් නොමැති නිසා ය.